**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 23/93**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993 සැප්තැම්බර් මස 27 වෙනි දින.

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

**තාවකාලික, අනියම්, ආදේශ සේවකයින්ට හා අභ්‍යාසලාභීන් සඳහා**
**<u>ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම</u>**

1993 ජූනි මස 17 දින අංක 14/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය වෙත ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

02. බඳවා ගැනීම් කාර්යයන් සඳහා අනියම්, තාවකාලික හා ආදේශක සේවකයින්ට අනුග්‍රාහක ලකුණු ලබා දීම 1993.05.09 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ. එබැවින් 1993.05.09 දින හෝ ඊට පසු බඳවා ගැනීම් සඳහා ගැසට් කරන ලද්දේ නම් අනුග්‍රාහක ලකුණු එකතු කළ යුතුය.

03. 1993.06.17 හා අංක 14/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ කොන්දේසි සපුරා ඇතොත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සියළුම අභ්‍යාසලාභීන් සඳහා ද අනියම්, තාවකාලික හා ආදේශක සේවකයින්ට ලබා දෙනු ලබන අනුග්‍රහය දීර්ඝ කරනු ලැබේ.

04. 1993.07.01 දින සිට අභ්‍යාසලාභීන් ලෙස රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කර ඇති අයගේ පුහුණුව වසර එකකට පමණක් සීමා කළ යුතු අතර, තවදුරටත් දීර්ඝ කිරීමක් නොකළ යුතුය. මෙම සීමා කිරීම ඉංජිනේරු හා වෙනත් සමාන්තර කාර්මික ක්ෂේත්‍රවල අභ්‍යාසලාභීන්ට අදාළ නොවේ.

.

අකලේ/එම්.ඩී.ඩී. පීරිස්
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය